**පොතුවිල් ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

**----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2019 මැයි15 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට පොතුවිල් ප්‍රාදේශීයසභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ වාහන 34 න් 30 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල වටිනාකම තක්සේරුකර ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වේ. | අදාල වාහනවල වටිනාකම් තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු කරන බවත් ඉදිරි මුදල් වර්ෂයේදි මෙම වාහන වල වටිනාකම නිසි පරිදි සටහන් කර මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කරන බව ඔබගේ අවධානය යොමු කරමි. |
| (ආ) | සභාව සතු ඉඩම් වල වටිනාකම තක්සේරුකර ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි. | සභාව සතු ඉඩම් වල වටිනාකම ස්ථාවර වත්කම් ලෙස ගිණුම්වල පෙන්විය යුතු වේ. | අදාල ඉඩම්වල වටිනාකම තක්සේරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු වහාම ගන්නා අතර, ඉදිරි මුදල් වර්ෂයේ මෙම ඉඩම්වල වටිනාකම අදාල සටහන් මගින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරන |

බව ඔබගේ අවධානය යොමු කරමි.

## 1.4 අනුකූල නොවීම

-----------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණකාධිකාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | 5(12) වගන්තිය | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වලට අත්සන් තබන නිලධාරීන් 3 දෙනෙකුගෙන් වර්ෂ 3 කට වඩා අධික කාලයක් තිස්සේ ආරක්ෂක ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම යන රාජකාරි පවරා ඇති නිලධාරීන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගත යුතු වේ. | පරිපාලනයෙන් ඇප මුදල් ලබා ගැනීමට ඉදිරිපත් වීමේදී අදාල නිලධාරීන් ඔවුන්ට පැවරූ රාජකාරි පැහැර හරිනඅවස්ථා ඇති බව දක්නට ලැබේ. අදාල පරිපාලන ගැටළු හේතුවෙන් නිලධාරීන්ගේන් ඇප ලබා ගැනීමට නොහැකිව ඇත. කෙසේ වෙතත්, අදාල රාජකාරි කරන නිලධාරීන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ii) | 193 වගන්තිය | අයවැය සමඟ අය සහ වැය විෂයයන් සසඳා අතිරික්ත හා ඌණතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල කාලයතුල ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | සභාවේ එක්එක් මුදල් වර්ෂයට අදාල ආදායම් සහ වියදම් සම්බන්ධ තොරතුරු අයවැය ලේඛනය සමඟ සසඳන අතර, ඒ සම්බන්ධ විස්තරාත්මක වාර්තාවක් ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ | 2012 වර්ෂයේදී තැන්පත් කර තිබූ රු. 50,000 ක ටෙන්ඩර් තැන්පත්, මුදල් | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | සඳහන් කළ ටෙන්ඩර් තැන්පත් සම්බන්ධයෙන් විස්තර ලබාගෙන අදාල පුද්ගලයාට ලබා දීමට හෝ |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල් රෙගුලාසි 571 | රෙගුලාසි අනුව ආපසු ගෙවීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | | ආදායමට මාරු කිරීම සඳහා කඩිනමින් කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | පළාත් මුල්‍ය රෙගුලාසි රීති අංක 163.3 | ගෙවන ලද සියළුම අත්තිකාරම් දින 10 ක ඇතුලත පියවිය යුතුබව සඳහන් කර තිබුණද, 2015 වර්ෂයේදි රු. 1,999,908 ක් වටිනා අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | පළාත් මුල්‍ය රෙගුලාසි අනුව අත්තිකාරම් ගෙවීම් පියවා ගිණුම්වල ගැලපුම් කළ යුතු වේ. | අදාල අත්තිකාරම් මුදල කාර්යාල ලිබඩු මිලදි ගැනීම සඳහා මධ්‍යම රජයේ අමාත්‍යාංශය මගින් පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ අනුව ලබා දී තිබුණි. මේ දක්වා කීපවතාවක් උත්සාහ කලද, මෙයට අදාල අග්‍රිම නොලැබීමෙන් අත්තිකාරම් පියවීමකින් තොරව තිබුණි. අදාල අග්‍රිම මුදල ලබාගෙන අත්තිකාරම් පියවීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාවේ පරිගණක, පරිගණක උපාංග හා පරිගණක මෘදුකාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | අදාල වැරදි නිවරදි කිරීම සඳහා පරිසණක, පරිසණක උපාංග සහ පරිසණක මෘදුකාංග විස්තර සටහන් කිරීම සඳහා සුදුසු ලේඛනයක් පවත්වාගෙන යාමටත් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | 2016 මාර්තු 31 දින 05/2016 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව විනාශ කළයුතු පුස්තකාල පොත් සහ විකිණිය යුතු භාණ්ඩ සම්බන්ධයෙන් 2019 මැයි 30 දිනය දක්වා කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ | රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | විනාශ කළයුතු, අළුත්වැඩියා කළයුතු සහ විකිණියයුතු භාණ්ඩවල මිල තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කළද, මෙතෙක් නිමවී නොතිබුණි. ඉදිරියේදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු අදාල පරිදි ක්‍රියාත්මක කර නිම කිරීමට කටයුතු කරන බවත් සමීක්ෂණ මණ්ඩල වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත |

| | | | | |
|---|---|---|---|---|
| | | සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඊ) | මොටර් වාහන ගමනා ගමන පනතේ 203 වගන්තිය | සභාවේ නඩත්තුව යටතේ පවතින වාහන 08 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව අදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | අදාල පනත අනුව වාර්ෂිකව සියළු වාහන සඳහා වාහන ආදායම් බලපත්‍ර ලබාගත යුතු වේ. | පරිපාලකයින්ගේ අනවධානය නිසා වාහන 8 ක බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. අදාල වාහන හඳුනාගෙන කඩිනමින් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (උ) | අංක 2008/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සේවක ආපදා ණය ගෙවීමේදි උපරිම සීමා රු. 250,000 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී මෙම සීමාව ඉක්මවා නිලධාරින් දෙදෙනෙකුට ණය ලබා දී තිබුණි. | චක්‍රලේඛය අනුකූල වන පරිදි ණය ලබා දීමට කටයුතු කළ යුතු වේ. | අදාල නිලධාරින් දෙදෙනා හඳුනාගෙන වැඩිපුර ලබාදී ඇති මුදල එම නිලධාරීන්ගේ අයකර ගැනීම සඳහා මාසික අවකරණ ප්‍රමාණය වෙනස්කර අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,920,147ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,968,249ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම්හා බදු | 2,005 | - | - | - | - | 3 | 3 | - |
| කුලී | 8,420 | 9,143 | 7,965 | 3,693 | 6,256 | 6,455 | 6,168 | 2,515 |
| බලපත්‍රගාස්තු | 3,380 | 3,234 | 3,234 | - | 2,268 | 2,829 | 2,829 | - |
| වෙනත් ආදායම් | 28,000 | 27,135 | 24,634 | - | 18,280 | 15,052 | 15,052 | - |

## 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය සඳහා වරිපනම් හා බදු අදායම් රු. 2,005,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙළද සැල් 656 සහ නිවාස 9,983 සඳහා 2003 වර්ෂයේ සිට වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභා බලප්‍රදේශයේ සංවර්ධනවූ ප්‍රදේශ හඳුනාගෙන එම ස්ථාන වලින් වරිපනම් බදු අයකිරීමෙන් සභාවේ ආදායම වැඩිකළ යුතු වේ. | දැනට මෙම ප්‍රදේශය දියුණු වූ ප්‍රදේශ වශයෙන් පෙනුනද, වාසය කරන ජනයාගේ වැඩිම කොටසක් දුගී අයවිය. පොදු ප්‍රතිපත්තිය වශයෙන් බදු අයකළහොත් වැඩි සංඛ්‍යාවට එය මගින් බාධා ඇති විය හැකි බැවින්, මෙය අයකිරීමට නොහැකි බව ඔබගේ අවධානයට යොමුකරමි. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ තිබෙන සමාලෝචිත වර්ෂයේ සභාවේ ලියාපදිංචි වී ඇති නවාතැන් හා භෝජන ශාලා 152 ක ආදායමෙන් 1% බදු අයකිරීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. | පනත අනුව බදු ආදායම අයකිරීමට කටයුතු කළ යුතු වේ. | නවාතැන්වල වාර්ෂික ආදායම්, ඔවුන් ඉපයු ආදායම්, එවැනි තවාතැන් ඉඩමේ වාර්ෂික වටිනාකම යන කරුණු පරීක්ෂණ කිරීම සඳහා පුහුණු කාර්ය මණ්ඩලයක් සභාවේ නොමැත. තවද, එම තොරතුරු ලබා ගැනීමෙන් පසු එම තොරතුරුවල සත්‍යතාව අපට සනාථ කිරීමට නොහැකි විය. එක් ආදායම් පරීක්ෂනවරයෙකු පමණක් සභාවේ සිටින බැවින් මෙම ආදායම් අයකර ගැනීමට නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2.2.4 කුලි

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදි අයවියයුතු හිඟ බදුකුලි රු. 1,778,614 ක් හා සමාලෝචිත | හිඟ බදුකුලි අයකිරීමට කටයුතු කළ යුතු වේ. | නැවතත් දැනුවත් කර හිඟ මුදල අයකිරීමට නොහැකි නම් අනාගතයේදී නීතියානුකූලව |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය අවසානයට රු. 2,806,430 ක ශේෂයක් තිබීමෙන් හිඟ බදුකුලී අයවීම මන්දගාමී විය. | | කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට අයවියයුතු හිඟ කඩ කාමර කුලී රු. 736,486 ක් වර්ෂ අවසානයේදී රු. 886,486 ක් වීමෙන් හිඟ කුලී අයවීම මන්දගාමී විය. | හිඟ කඩකුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හඳුනා ගන්නා ලද හිඟ කුලී අයවියයුතු අයගෙන් එය අයකරගැනීම සඳහා බේරුම් කිරීමේ මණ්ඩලය මගින් කටයුතු කරන අතර එසේ නොහැකිනම් නීතියානුකූලව කටයුතු කරනු ලැබේ. |

**2.2.5** මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂ අවසානය දක්වා අයවියයුතු මුද්දර ගාස්තු රු. 12,802,672 ක මුදලින් සියයට 22 ක් වන රු. 2,834,192 ක හිඟ මුදල පමණක් අයකර ගෙන තිබුණි. | අදාල මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවට ලැබිය යුතු 2016,2017 සහ 2018 වර්ෂවලට අයත් මුද්දර ගාස්තු ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණය වු කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ විධිමත් කිරීම සඳහා ප්‍රධාන කාරණා 20 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්ති අනුව අතුරු ව්‍යවස්ථා | පිළිතුරු එවා නැත. |

| | |
|---|---|
| කටයුතු කර නොතිබුණි. | සකස්කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස්කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතින්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයම ක්‍රියා කළයුතුයි. එසේ වුවත් මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ලඟා කරගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන ඒවා මැණීම සඳහා දර්ශක හඳුනාගෙන ලඟා කර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිතුරු එවා නැත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ ධාවන තත්වයේ තිබෙන මෝටර් වාහන 13 කින් එක් වාහනයක් හැර අනෙකුත් වාහන 12 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂණ පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය අනුව සභාව සතු වාහනවල ඉන්ධන පරික්ෂණ පවත්වා ධාවනයේ යෙදවිය යුතු වේ. | ඉන්ධන පරීක්ෂණ පැවැත්විය යුතු සියළුම වාහන සඳහා ඉන්ධන පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සභා බලප්‍රදේශයේ ඉපදෙන ළදරුවන්ගෙන් අඩුබර ළදරුවන්ගේ ප්‍රතිශතය 2015,2016,2017 සහ 2018 වර්ෂවලදි පිළිවෙලින් 10%, 10.3%,9.2% සහ 10.6% ක් වශයෙන් තිබුණද, 2019 වර්ෂය දක්වා | වාර්ෂික අයවැය සකස්කිරීමේදි ප්‍රදේශයේ ජනයාගේ සුභ සාධන සම්බන්ධයෙන් | මෙවැනි අඩුබර ළදරුවන්ගේ ප්‍රතිශතය සම්බන්ධ වාර්තාව අනුව ඉදිරියේදී වැඩි අවධානය යොමු කරන බව දැනුම් |

| | | |
|---|---|---|
| අයවැය ලේඛනයෙන් මව්දරු සුභ සිද්ධිය ළමා නඩත්තු කිරීම සඳහා වැය කිරීමට මුදල් වෙන්කර නොතිබුණි. | අවධානය යොමු කළ යුතු වේ . | දෙමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සහායක ආදායම් පරික්ෂක සහ සංවර්ධන නිලධාරි යන තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | අදාල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කරන බව ඔබගේ අවධානය යොමු කරමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක PAC06/2006 ක අනුව පුස්තකාල සහායක 06 ක් සහ සෞඛ්‍ය සේවකයන් 08 ක් සභාව විසින් පත්තර තිබුණ ද මෙම කාර්ය මණ්ඩලය සඳහා අනුමැති (Cadre Approved) ලබාගෙන නොතිබුණි. | අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |
| (ඇ) | 2017 සහ 2018 වර්ෂ අවසානයේදි වැඩිපුර අයකර ඇති සේවක ණය පිළිවෙලින් රු. 55,765 සහ රු. 100,420 ක් ආපසු නොගෙවා තිබුණි. | වැඩිපුර අයකරගත් මුදල අදාල නිලධාරින්ට ආපසු ගෙවීමට කටයුතු කළ යුතු වේ. | වැඩිපුර අයකර ගත් මුදල හඳුනාගෙන අදාල නිලධාරින්ට නැවත ගෙවීමට ක්‍රියා කරමි. |
| (ඈ) | සේවකයන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ සේවක ණය රු. 559,552 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට අයනොවී තිබුණි. මෙම හිඟ මුදල ඇපකරුවන්ගෙන් අයකිරීමට හො ඔවුන්ට එරෙහිව නීතියානුකූලව කටයතු කිරීමට 2019 මැයි 30 දින දක්වා කටයුතු කර නොතිබුණි. | සේවක ණය ශේෂ අයකිරීමට හෝ ඔවුන්ට එරෙහිව නීතියානු කූල කටයුතු කළ යුතු වේ. | මෙය කඩිනමින් අයකර ගැනීමට නොහැකිවුගොත් නීතියානුකූලව කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | එක් නිලධාරියෙකුට ගෙවීම සඳහා 2009 වර්ෂයේදී ලැබී තිබූ විශ්‍රාම පාරිතෝෂිකය රු. 103,747 ක මුදල මෙතෙක් එම නිලධාරියාට ගෙවා නිරවුල් කර නොතිබුණි. | සේවක පාරිතෝෂිනය ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල කටයුතු වහාම ගනු ලැබේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 අයිතිය පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වෙනත් ආයතවලින් පරිත්‍යාග වශයෙන් ලැබී සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 08 ක් පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | වාහන සභාවේ නමට මාරු කිරීම සඳහා කටයුතු යළ යුතු වේ. | අයිතිය පවරා ගැනීම් කටයුතු කඩිනමින් කර ගැනීමට සැලසුම් කර ඇත. |
| (ආ) | සභාව ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් 46 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා සභාවේ නමට අයිතිය පවරා නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල ඉඩම් හඳුනාගෙන එම ඉඩම්වල ලියවිලි පරීක්ෂා කර එහි අයිතිය නීත්‍යානුකූලව මාරු කිරීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ. |

### 3.4.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රයෝජනයට නොගෙන තිබූ ට්‍රැක්ටර් රථ 06 ක්, ටේලර් වතුරු ටැංකි 02 ක්, යතුරුපැදි 02 ක්, ටේලර් 02 ක් සහ කබ් රථයක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කර නොතිබුණි. | වාහන අළුත්වැඩියා කර නැවත ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කළ යුතු වේ. | විගණන උපදෙස් අනුව ප්‍රයෝජනයට නොගන්නා ස්ථාවර වත්කම් හඳුනාගෙන එය අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙන්දේසි කර විකිණීමට කටයුතු කරනු ලැබේ. |

### 3.4.3 වාර්ෂික භාණ්ඩ / තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් පෙන්වා තිබූ පරිදි පුටු 40 ක, පොරොව 09 ක, උදළු 30 ක සහ පික්කස් 09 ක ඌනතාවය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුවද, මුදල් රෙගුලාසි අනුවද කටයුතු කළ යුතු වේ. | සමීක්ෂණයේදි පෙන්වා දුන් භාණ්ඩ ඌනතාවය සම්බන්ධයෙන් ඉදිරියේදි අවශ්‍ය කටයුතු කරන බව ඔබගේ අවධානය යොමු කරමි. |

### 3.4.4 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ ආදායම වැඩිකර ගැනීම සහ රැකියා අවස්ථා ඇතිකර ගැනීමේ අරමුණෙන් 2008 වර්ෂයේදී වර්ල්ඩ් විෂන් ආයතනයෙන් රු.1,231,000 ක් සහ 2011 වර්ෂයේ සභා අරමුදලින් රු. 1,612,127 ක් යොදා ගනිමින් කඩදාසි ප්‍රතිචක්‍රීය කරන මධ්‍යස්ථානය ඉදිකර තිබුණ ද, මේ දක්වා එය ප්‍රයෝජනයට නොගැනීම නිසා විනාශ වෙමින් පැවතුනි. | අදාල වත්කම් අදාල කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉතිරි වැඩ කොටස නිම කර දෙන ලෙසත්, සේවක පුහුණුවක් සහ වෙනත් ආධාර ලබා දෙන ලෙසත් වර්ල්ඩ් විෂන් ආයතනයට දැන්වූවද, ඔවුන්ගෙන් පිළිතුරු ලැබී නොතිබුණි. එය ක්‍රියාත්මක කිරීම සඳහා විදුලි බලයක් නොමැතිවීම, පුහුණු කාර්ය මණ්ඩලයක් නොමැතිවීම, දැනට සවිකළ යන්ත්‍ර සූත්‍ර මලබැඳී තිබීම යන හේතුවෙන් මෙය විකිනීමට තීරණ කර ඇති බව දන්වා සිටිමි. |

## 3.5 ප්‍රසම්පාදන

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 128 දරන 2006 මාර්තු 24 දින චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සභාව විසින් සකස්කර නොතිබුණි. | වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්ම සකස්කළ යුතු වේ. | අදාල චක්‍රලේඛ අනුව ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කිරීමට අවශ්‍ය කටයුතු සභාව විසින් තීරණය කර ඇත. |

### 3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සෙන්කාමම් මාර්ගයට කොන්ක්‍රීට් කිරීමේ වැඩ යටතේ වැඩ අංක 07 මාර්ග දෙපස බොරලු පස් දමා සකස්කිරීම සඳහා රු. 38,666 ක් 2018 නොවැම්බර් 30 වන | කොන්ත්‍රාත් නීති අනුව මාර්ග දෙපැස පස්දමා | වැඩ විෂය 7 හි 2018 දෙසැම්බර් මාස සහ 2019 ජනවාරි මාස අධික වර්ෂාව පතනයක් තිබු නිසා මාර්ග |

| | | |
|---|---|---|
| දින වැඩ නිමකර ඇති බවට ගෙවීම් අනුමත කර තිබුණද, 2019 මාර්තු 15 දින ක්ෂේත්‍ර පරීක්ෂණයේදි මාර්ගයේ දකුණු පස දමන ලද පස් සේදි ගොස් තිබුණි. | සකස්කිරීම් කටයුතු කළ යුතු වේ. | දකුණු පස දමන ලද පස් සේදී ගොස් තිබුණි. රැදවුම් මුදල් ආපසු ගෙවීමට ප්‍රථම මෙම අඩුපාඩු සකස්කර ගන්නා බව දන්වමි. |

## 4 ගිණුම් ගතයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15(1) උප වගන්තිය අනුව එක්එක් මුදල් වර්ෂ අවසන් වී මාස තුනක් ඉකුත් වීමට ප්‍රථම මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ කෙසේ වූවද, මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ මූල්‍ය ප්‍රකාශනය අදාල කාලයතුල ඉදිරිපත් කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි. | අභ්‍යන්තර විගණන කමිටු පිහිටුවා අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා රැස්වීම් පවත්වීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |